සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙනකවය තුළ (×) ලකුණ යොදන්න.

---

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයටවඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(01) නිදහස් දිනයේ දී පැවැත් වූ ගුවන් යානා සංදර්ශනය දෙස නරඹන්නෝ **මුව අයාගෙන** බලා සිටියෝ ය.

1. ප්‍රීතියෙන්  2. විස්මයෙන්
3. විමසිල්ලෙන්  4. අපහසුවෙන්

(02) සෞඛ්‍ය ගැටලු නිසා සේවකයන්ගේ ඉල්ලීම් **හරි හතරැස් විදිහට** ලබා දිය නොහැකි බව නායකයෝ පවසති.

1. අංග සම්පූර්ණ ව  2. චතුරශ්‍රාකාර ව
3. අලංකාර ලෙස  4. නියමිත කාලයට

(03) 'නිවසේ අයිතිය ලොකු අයියාට පැවරීම ගැන **හිතේ කහටක්** ඇති කර ගන්න එපා' යයි තාත්තා පැවසුවේ ය.

1. කුතුහලයක්  2. සැකයක්
3. අමනාපයක්  4. කම්පාවක්

- අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය පිණිස බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය හිමිපාණෝ ................ සේවයක් කළෝ ය .

1. අසමාන  2. විධිමත්
3. පරිමිත  4. අපරිමිත

(05) ප්‍රතිභාපූර්ණ ලේඛකයන්ගේ නිර්මාණවල අපූරු පද .................. දැකිය හැකි ය.

1. විවරණයක්  2. සංයෝජනයක්  3. සංගණනයක්  4. මාධ්‍යයක්



EXAMRESULTS.LK

(06) පේරාදෙණිය සරසවිය ලෝකයේ විශිෂ්ටතම සරසවි .................... බවට පත් කිරීමට ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා කැපවීමෙන්කටයුතු කළේ ය.

1. නිවාරණයක් 2. ව්‍යාපාරයක් 3. නිකේතනයක් 4. නිවාසයක්

(07) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි පද පේළිය තෝරන්න.

1. ආඛ්‍යාණය , අවසාධිත , කර්ථව්‍ය , යතාර්ථය
2. දෘෂ්ටිශෝචර , සම්මන්ත්‍රණය , සුවිශද , භාෂණය
3. නිපුනතාව , සමස්ථ , වාර්ශික , නිශ්චිතාර්ත
4. ආශ්වාදය , ඓතිහාසික , කාර්යාලය, දර්ශණය

(08) අකාරාදි පිළිවෙළට නම් යෙදී ඇති වරණය තෝරන්න.

1. වාරියපොල , වාද්දුව , වේරහැර , වේයන්ගොඩ
2. ගලිගමුව , ගනේතැන්න , කඩුගන්නාව , කඩවත
3. දියතලාව , පැල්මඩුල්ල , පාමංකඩ , පාදෙණිය
4. කටුනේරිය , කටුපොත , කරවනැල්ල , කලවාන

(09)) වර්ගාන්ත අක්ෂර පමණක් ඇති පිළිතුර කුමක් ද ?

1. ක, ච ,ට ,ත, ප
2. ඞ,ඤ,න, ණ, ම
3. ග, ජ, ඩ, ද ,බ
4. ග, ජ, ඩ, ද,බ

(10) මහාප්‍රාණ අක්ෂර පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1. සංවරණය , ප්‍රහර්ෂය , ඥාණය , සංඥාව
2. අඹර , ඓක්‍යය , විශාරද , ළාමක
3. නිර්දිෂ්ට , සම්භවය , කටරොළු , ධාරිතාව
4. මජ්ඣිම , විරූඪ , අවස්ථාව , පරිච්ඡේදය

(11) මුලින් දී ඇති පදයේ සමානාර්ථ නො දෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. සිරිකත - පියුමම්බා , සිරිදුව, සිරිසඳ , ලක්ෂ්මී
2. රශ්මිය - කිරණ , රැස් , කැලුම් , කැන්
3. පොකුර - කලඹ ,කැන , බරණ , මඤ්ජරී
4. කෝපය - තරහ , රොස් , කේන්තිය , උරණ

(12) මුලින් දී ඇති පදයේ විරුද්ධාර්ථ දෙන පිළිතුර තෝරන්න

1. යත්නය - උත්සාහය, උනන්දුව, ප්‍රයත්නය , දිරිය
2. සස් - සත්‍යය, අස්වැන්න, සඳ , හංසයා
3. දුර්දාන්ත - කීකරු, දාන්ත , දැමුණු , හික්මුණු
4. පටල - වැස්ම , සමූහය, පලිහ, මැස්ස

(13) නාම විශේෂණයක් හා ක්‍රියා විශේෂණයක් නොමැති වාක්‍යය තෝරන්න.

1. රසායනික පොහොර නොමැති නිසා ගොවීහු කනස්සල්ලෙන් සිටිති.
2. ක්‍රීඩකයෝ තරගය සඳහා උදෑසනම පිටියට පැමිණියෝ ය.
3. ආධුනික ගායකයෝ විනිශ්චය මණ්ඩලයගෞරවයෙන් පිළිගත්තෝ ය.
4. අවංක නිලධාරීහු ජනතාවගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කර දෙති.

(14) එක් පදයක පමණක් අර්ථය ඇති යුගල පද ඇතුළත් වරණය තෝරන්න.

1. ගණන් හිලවු , තරහ මරහ , සද්ද බද්ධ , නහිනදෙහින
2. ඇති නැති , එහා මෙහා , උස්පහත් , කුඩු මහත්
3. දුගී මගී , වස විස , වැර වෑයම , අරුම පුදුම
4. කවා පොවා , දුව පැන , හඬා දොඩා , කියුම් කෙරුම්

(15) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නො වන පදයක් සහිත පිළිතුර තෝරන්න.

1. තද්ධිත නාම - සුළුතර , සාමාජික , ග්‍රාමීය , පිත්වත්
2. කෘදන්ත නාම - ලියන්නේ , නිතර , ගැයූ , රැඟුම්
3. උපසර්ග - සම්ප්‍රාප්තිය , අනුබද්ධ , සුසිරිත , ප්‍රතියෝජක
4. නිපාත - එව් , පිණිස , යළි , නිබඳ

(16) "අ"කොටසෙහි ඇති ක්‍රියා ප්‍රභේදවලට අයත් ක්‍රියා පද "ආ"කොටස සමඟ ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ වන්නේ ,

| අ | ආ |
|---|---|
| අසම්භාව්‍ය ක්‍රියා | 1. විමසමින් |
| ප්‍රයෝජ්‍ය ක්‍රියා | 2. සුරකිනු |
| මිශ්‍ර ක්‍රියා | 3. වයත |
| විධි ක්‍රියා | 4. ගයවයි |

1. 3,4,1,2 2. 2,1,3,4 3. 4,2,3,1 4. 1,3,4,2

(17) මුල් අකුරෙහි දීර්ඝ පාපිල්ල , ගැටය සහිත ඇලපිල්ල , දීර්ඝ ඇදපිල්ල , ඇලපිල්ල පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

1. දූලබ , කුසීත , සූකිරි , මැදිරිය
2. ග්‍රන්ථය , නෞකාව , තෘෂ්ණාව , මිහිරි
3. රූස්ස , දෘෂ්ටිය , දෑස , සාමය
4. සෑය , කෘමියා , නූගත් , දැහැන

(18) A - ස්වර සන්ධිය - වමතින්
B - පූර්වස්වර ලෝප සන්ධිය - සිහසුන
C - ස්වරාදේශ සන්ධිය - මහෝපකාර
D - ආගම සන්ධිය - ජනාදරය

ඉහත දක්වා ඇති A , B , C , D යුගල අතුරෙන් නිවැරදි යුගලය වන්නේ,

1. B හා C ය. 2. A හා D ය. 3. B හා D ය. 4. A හා C ය.

(19) **ඇමරිකාවේ** සිට **ගුවන් යානයෙන්** රැගෙන ආ එන්නත් **වෛද්‍යවරු** ශීත **ගබඩාවල** තැබූහ.

ඉහත වාක්‍යයේ කළු අකුරින් මුද්‍රිත පද අයත් විභක්ති අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ප්‍රථමා , අවධි , කර්තෘ , කර්ම
2. අවධි , කරන , ප්‍රථමා , ආධාර
3. කර්ම , ආධාර , සම්ප්‍රදාන , අවධි
4. ආධාර , කර්ම , කර්තෘ , අවධි

(20) මුලින් දක්වා ඇති පදවල අර්ථ නිවැරදි ව සඳහන් පිළිතුර කුමක් ද ?

1. වැරසැර - වීර සාර , ප්‍රගතිය - ප්‍රගමනය , පබා - ප්‍රභාව , නොවිතර- අප්‍රමාණ
2. නුනුවණ - ඥානවන්ත , නරමුල් - නහර , විරත්තන - නූතන , උවම්- උපදෙස්
3. රිසි - සුදුසු , ප්‍රාචීන - අපරදිග , අකුස්ස - හෙණ්ඩුව , අනුන - අඩු
4. පෘථුල - පටු , ආජ්ත - ළාබාල , වර -උතුම් , පටිමා - චෛත්‍යය

(21) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.

1. ඍ , ර , ෂ අක්ෂරවලට පසුව මූර්ධජ "ණ" යෙදේ.
2. කර්ම කාරක වාක්‍යවල දී කර්මය ප්‍රථමා විභක්තියෙන් යෙදේ.
3. ඒ ඒ චරිත ලවා ම එම චරිතවල සිතුවිලි අනාවරණය කිරීම විඥානධාරා රීතිය යි.
4. ච , ෆ කණ්ඨ තාලුජ අක්ෂර ගණයට අයත් වේ.

(22)
A. සමහරු තමන්ගේ වාසිය ..................... පරිසරයට වන හානිය ගැන නොසිතති.
B. සෞඛ්‍ය උපදෙස් පිළිපදින්නේ ................ රෝග බෝවීම අවම කර ගත හැකි ය.
C. පරිසරය ............... සියලු සත්ත්වයන්ට අමිල සම්පතකි.
D. අධික වර්ෂාව පැවති ................. ශ්‍රමදානය පැවැත්වීමට නොහැකි විය.

E. වනාහී F. මිස G. හෙයින් H. නම්

ඉහත A , B , C , D වාක්‍යවල හිස්තැනට සුදුසු නිපාත අනුපිළිවෙළ වන්නේ ,

1.. G,E,H,F 2. F,H,E,G 3. E,F,G,H 4. H,G,F,E

(23) සංස්කෘත උපදේශ කාව්‍යයක් වන්නේ ,

1. නාලඩියාර් 2. හිතෝපදේශය
3. සිරිත් මල්දම 4. සුභාෂිතය

(24) අනාර්ථ සමාසයට අයත් පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. සවත් , මරරුපු , ලම්බෝදර , විදුරවි
2. සුසිරිත් , නොහොඳ , සංරක්ෂණය , නිශ්චල
3. හෙළදිව , රන්කම් , මුනි පුද , අහස් දිය
4. මුවපියුම , දසසිල් , සසුනඹර , නිලුපුල්

(25) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප සම්බන්ධතාවක් නොමැති පද පේළිය තෝරන්න.

1. ඉරිවේරිය , පොල් පලා , රසකිඳ , තිප්පිලි
2. පැපොල් , අන්නාසි , ඇපල් , පේර
3. මයිනා , පොල්කිච්චා , ලේනා , ගිරවා
4. කිතුල් , තල් , පුවක් , පොල්

(26) උපමාවක් හා රූපකයක් නොමැති වරණය තෝරන්න.

1. සංසාරේ තෙර දකින්න බලාපොරොත්තුවෙ ඔරුවෙන්
2. මතු දවසේ මේ පොළවේ සූරිය මල නුඹ නිසා ය.
3. නැමී බැම සුරිඳු සැව් වන්
4. කළු වලා කැලඹෙමින් මුදුන් වී නැඟෙනවා

(27) අනියමාර්ථ අනුක්ත නාම පදයක් සහිත පිළිතුර තෝරන්න.

1. ලිපිකරුවන්
2. ලිපිකරුවෙකු
3. ලිපිකරුවෙක්
4. ලිපිකරුවා

(28) සර්ව නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න .

1. වානරයෝ, ඔවුන් ,විල් , ශේ
2. ඔහු ,නුඹලා ,ඕ ,තෝ
3. අනේ ! , අහෝ ! , අහා ! , අයියෝ!
4. කැල,පෙළ,ගණ,පිරිස

(29) මුලින් දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

අප්‍රසාදය කටින් නොකියා ක්‍රියාවෙන් දැනුම්වත් කිරීම.

1. බල්ලන්ට ලෙලි පොල් දුන්නා වගේ
2. දෙබරෙට ගල් ගැහුවා වගේ
3. පල නොකියා පලා බෙදනවා වගේ
4. උරුලෑවා ගිය පාර වගේ

(30) නිවැරදිව පද බෙදා ඇති වාක්‍යය තෝරන්න.

1. විවිධ ලේඛන සම්පාදනය කර ගැනීමට මෙන් ම විවිධ කරුණු සොයා ගැනීමට ද විශ්වකෝෂ වැදගත් වේ.
2. බහුසෛලික ජීවීන්ගේ ෆොසිල හමුවන ශ්‍රී ලංකාවේ පැරණිතම යුගය ලෙස ජුරාසිකයුගය හැඳින්විය හැකිය.
3. භාෂාවේ විභවතා උපයෝගීකරගත් මිනිසා ජීවලෝකය මෙන් ම ද්‍රව්‍ය ලෝකය ද පාලනය කිරීමේ ශක්තිය අයිති කරගෙන තිබේ.
4. ලෝක ජනගහනයෙන් වැඩි කොටසක් පිරිසිදු පානීයජලය ලබා ගැනීමට නොහැකි තත්වයක ට මුහුණදී ඇත.

(31) මාධ්‍යවේදීන් වැඩසටහන කරන කොට අපි බලා සිටියා.

ඉහත වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න.

1. මාධ්‍යවේදීහු වැඩසටහන කරද්දී අපි බලා සිටියෙමු.
2. මාධ්‍යවේදීන් වැඩසටහන කරද්දී අපි බලා සිටියෙමු.
3. මාධ්‍යවේදීහු විසින් වැඩසටහන කරද්දී අප බලා සිටියෝ ය.
4. මාධ්‍යවේදීහු වැඩසටහන කරද්දී අප බලා සිටියෙමු.

(32) "විශාරද" යන පදයට "ය" ප්‍රත්‍යය එකතු කළ විට සෑදෙන නිවැරදි පදය කුමක් ද ?

1. විශාරදය
2. විශාරද්‍ය
3. වෛශාරද්‍ය
4. වෙයිශාරද්‍ය

(33) "උගේ හපන්කම් විදියට ඔතනට වඩා ගැළපෙන තවත් තැනක් නෑ "

මෙම ප්‍රකාශය ඇතුළත් නාට්‍යය වන්නේ ,

1. ගුරු තරුව
2. හුණුවටයේ කතාව
3. සඳගිර
4. තල මල පිපිලා

(34) දිගාමඩුලු උප භාෂාවේ "බෝල්ලු" නමින් හඳුන්වන්නේ ,

1. ගෝනුන්
2. මීහරක්
3. වලස්සු
4. අලි

(35) පහත සඳහන් කවියෙහි අවසාන පාදය තෝරන්න.

රන් දැකැති අරන් දෙන්නා දෙපස සිට
බට පොතු පෙට්ටි පුරවා එක පිට එකට
නැනේ වරෙන් ඒ අස්වන් නෙළන්නට
............................................ ............

1. මඳු මල් පිපෙනවා හේනේ වැට දිගට
2. කුරහන් පැසී මොකටද නුඹ නැති ආට
3. උඹේ කටින් ගී සීපද අහන්නට
4. තවමත් ගිරවු එනවා පෙර පුරුද්දට

(36) සෙංකොට්ටං , වතුර මල යන සාහිත්‍ය නිර්මාණ ලියූ ලේඛකයන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සිරි ගුණසිංහ , මහගමසේකර
2. ඒ.වී.සුරවීර , ඩබ්.ඒ.අබේසිංහ
3. කීර්ති වැලිසර , කේ.ජයතිලක
4. මහින්ද ප්‍රසාද් මස් ඉඹුල , ඇරැව්වල නන්දිමිත්‍ර

(37) බුජ බල පළ කළ සුරු නරවිරු කැල

මෙහි ‘නර විරු කැල’ යන්නෙන් අදහස් වන්නේ ,

1. මිනිස් වීරයන් සමූහය
2. නොයෙක් වීරයන්
3. වීර රජවරුන්
4. උගත් මිනිසුන්

- අංක 38 , 39 යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

(38)
1. ප්‍රවීණ ලේඛකයන් සාකච්ඡාවට සහභාගි වෙති.
2. ආදි ශිෂ්‍යයන් උත්සවය සංවිධානය කරති'යි ගුරුවරු සිතුහ.
3. වර්ෂාවෙන් බොහෝ ප්‍රදේශවලට හානි සිදු වූහ.
4. සියලු නිලධාරීහු අවංකව සේවය කළ යුතු ය.

(39)
1. විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන් නැත.
2. හංසයෝ පැටවූ කැටුව විලට ආවෝ ය.
3. නුඹ නොහොත් මම රැස්වීමට යන්නෙහි.
4. සභාපතිතුමා යහපත් මාර්ගෝපදේශකයෙකු මෙන් වගකීම් ඉටු කළේ ය.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් **සමීප අදහස** දෙන පිළිතුර තෝරන්න.

පුරා විද්‍යා කැණීම් වලින් හෙළිවන කරුණු වලින් මෙතෙක් අප නැසූ විරූ තොරතුරු රාශියක් දැන ගත හැකි වේ .

1. අප නොදන්නා බොහෝ කරුණු පුරා විද්‍යා කැණීම් නිසා අනාවරණය වේ.
2. පුරා විද්‍යා කැණීම් මගින් ලැබෙන ආලෝකය අපේ ඉතිහාසය වෙනස් කරන්නේ ය.
3. මෙතෙක් අප්‍රකටව පැවති තොරතුරු හෙළිකර දීම පුරා විද්‍යා කැණීම් වල අරමුණයි.
4. පුරා විද්‍යා කැණීම් වලින් ඓතිහාසික මූලාශ්‍ර හඳුනා ගත හැකි ය.

(ලකුණු 1×40 =40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## மேல் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021-
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

(01) ( i ) සිට ( x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් අඝෝෂ , මහාප්‍රාණ අක්ෂරයක් ලියන්න.

(ii) පහත දැක්වෙන පදවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) වණ (ආ) වන

(iii) පහත සඳහන් වාක්‍ය සදොස් ය.එම වාක්‍ය නිදොස් කර ලියන්න.

(අ) අපි නිවසට යද්දී විදුලි පහන් දැල් වී තිබිණි.
(ආ) ඔවුහු සියල්ලන්ම කොවිඩ් මර්දන එන්නත ලබා ගත්හ.

(iv) මෙහි සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) උත්කෘෂ්ට (ආ) තිමිර

(v) පහත සඳහන් වාක්‍ය වල තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති ලියන්න.

(අ) අපි මෙවැනි අවස්ථාවල **අනුවණයන්** ලෙස නො හැසිරෙමු.
(ආ) වෛද්‍යවරු රෝගීන් **ආරක්ෂා කරනු වස්** බැඳී සිටිති.

(vi) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

(අ) කම්මුල (ආ) කුරුල්ලා

(vii) පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පද අයත් වන ක්‍රියා ප්‍රවර්ගය ලියන්න.

ජනයා නගරයට <u>පැමිණෙත්ම</u> ඇතැම්හු තම වෙළඳාම් කටයුතු <u>ආරම්භ කර</u> තිබුණි.

(viii) පහත සඳහන් වාක්‍යයේ ඇති සමාස පද **දෙකක්** උපුටා ලියන්න.

මඳ අඳුර කෙමෙන් කෙමෙන් පැමිණෙත්ම තාරපති අහසේ නැගෙන්නට විය.

(ix) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) ගුරුවරු සිසුන් ඇගයීමට ලක් කළහ.
(ආ) විදුහල්පතිතුමා මාර්ගගත අධ්‍යාපනය පිළිබඳව ගුරුවරියක දැනුම්වත් කරයි.

(x) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.

(අ) වරදට පෙළඹුණු පුද්ගලයකු නැවත නගා සිටුවීම
(ආ) කිසිසේත් යටපත් කළ නොහැකි

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන ( අ) , (ආ) , (ඉ) , (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අප රටේ ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වීමත් සමඟම රට තුළ සිදු කෙරෙන වේගවත් සංවර්ධනය හේතුකොට ගෙන ජල විදුලිබල ඉල්ලුම ද වාර්ෂිකව වැඩි වී ඇත. රටපුරා තැනූ අධිවේගී මාර්ග , මහා පරිමාණයේ ව්‍යාපෘති ආරම්භ කිරීම පමණක් නොව ඒවා පවත්වාගෙන යාමට ද ඉතා ඉහළ විදුලිබල ඉල්ලුමක් ඇත. ඉදිරියේදී ඇතිවිය හැකි බලශක්ති හිඟයට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කළ යුතු බව එම ක්ෂේත්‍රය හා සම්බන්ධ බලධාරීන්ගේ අදහස වී ඇත.

(ආ) ප්‍රථමයෙන්ම කෘෂිකාර්මික ක්‍රමය ලෙස ක්‍රියාවට නැගුණේ කිසියම් බීජ ප්‍රමාණයක් වපුරා සොබා දහමට අනුව ඉන් අස්වැන්න ලබා ගැනීමයි. කාලයත් සමගම මෙම ක්‍රමය අර්බුද රැසකට ලක් විය. එමනිසා බෝග වර්ග වගා කිරීම හා අස්වැන්න ලබා ගැනීමේදී විවිධ ක්‍රම භාවිත කළ අතර වගාකරුවන්ගේ ඉලක්කය වූයේ ද වැඩි ඵලදාවක් ලබා ගැනීමයි.මෙහිදී ඇතැම් රසායනික ද්‍රව්‍ය හිතකර නො වූ බව අපට පිළිගන්නට සිදුව ඇත.එම නිසා පරිසර හිතකාමී ගොවිතැනට විතැන් වීම ක්‍රමානුකූලව සිදු විය යුතු කාලය එළඹ තිබේ.

(ඉ) අද සමාජයේ විවිධාකාර ගැටලුවලට මැදි ව නිරතුරුව අසහනයෙන් දිවි ගෙවන ළමා , තරුණ, වැඩිහිටි, මහලු ජන කොට්ඨාස පිළිබඳව අසන්නට ලැබේ.මෙම පිරිස ප්‍රශ්නවලින් පලා යාම සඳහා සහ ඒවා විසඳා ගැනීමට නොහැකිව කලකිරීමට හෝ අසරණ තත්ත්වයට පත්වීම රටේ ප්‍රගමනයට මහත් බාධාවකි. මෙවැනි අවස්ථාවලදී ඔවුන්ට නිසි මඟ පෙන්වීමෙන් ඔවුන්ගේ ජීවිත සාර්ථක කළ හැකි ය.ඒ සම්බන්ධයෙන් සානුකම්පික සහ සුහදශීලී වෘත්තීමය උපදේශන සේවාවක් ගොඩ නැගිය යුතු ය.

(ඊ) මේ වන විට ද දරුණු වසංගතයක අමිහිරි මතකයන් අප සිත් සතන් තුළින් පහව ගොස් නැත. මෙහි වඩාත් සංකීර්ණ කාරණය වන්නේ පශ්චාද් වසංගත තත්ත්වයයි , එනම් එවැනි කාල පරිච්ඡේදයකින් පසුව රටක් මුහුණපාන ආර්ථික සහ සමාජමය ගැටලු ය. මෙහිදී බිඳවැටුණු නිෂ්පාදන ක්‍රියාවලින් ශක්තිමත් කිරීමටත්, මග හැරුණු සංවර්ධන ව්‍යාපෘති යළි ඇරඹීමටත්, අතපසු වුණු අධ්‍යාපන කටයුතු ක්‍රමවත් කර ගැනීමටත් අප යොමු විය යුතු ය. එයට ක්‍රමානුකූල ක්‍රමවත් වැඩපිළිවෙළක් අවශ්‍ය වේ.

(ලකුණු 25 යි)

(03) පහත දැක්වෙන පාඨය **වචන 65 - 75** අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න

ශ්‍රී ලාංකික අපි වාරි ශිෂ්ටාචාරයට අයත් ජන කොටසක් වන්නෙමු එදා සිටම රටෙහි ආර්ථික, සාමාජික හා සංස්කෘතික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තය මුල් වූ අතර,එහි පැවැත්ම හා බැඳී පැවතුණේ වාරිමාර්ග පද්ධතිය යි. එබැවින් රටේ පාලනයට පත් වූ පාලකයන් තමාගේ ප්‍රධානතම වගකීම ඉටු කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස අද පවත්නා වාරිමාර්ග පද්ධතියේ ආරම්භය ඇති විය. මේ ආකාරයට ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂණය කිරීම සඳහා වී වගාවට අත්‍යවශ්‍ය ජල සම්පාදනයට මූලික වූ වැව් රට පුරා තැනීම එදා ලක් රජවරුන්ගේ වැදගත්ම රාජ්‍ය ප්‍රතිපත්තියක් විය.

මුල් යුගයේ සිටි රජවරු කුඩා වැව් තනා අහස් දිය රැස්කර ගැනීමෙන් කෘෂි කර්මාන්තය නංවාලීමට සමත් වූහ. ක්‍රමයෙන් මෙම ගම්මාන නාගරීකරණය වෙද්දී ජන සංඛ්‍යාව මෙන්ම මිනිස් අවශ්‍යතා ද වැඩිවෙත් ම ජලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා වාරි කර්මාන්තය දියුණු කිරීමට රජවරුන් උනන්දුවීම නිසා වැව් වලට අමතරව ඇළවල් තැනීම ද සිදු විය. කලාවැවේ සිට අනුරාධපුර නගරයේ පිහිටි තිසා වැව සහ බසවක්කුලම වැව වෙත ජලය රැගෙන යාමේ යෝධ ඇළ හෙවත් ජය ගඟ මෙසේ නිර්මාණය වූවකි. මෙම යෝධ ඇළ ඉදිකිරීම නිසා විශාල ජල පෝෂක ප්‍රදේශයක් ආර්ථික සංවර්ධනයට යොදා ගැනීම පහසු විය.මේ නිසා ඇලවල් දෙපස ප්‍රදේශ ජනාකීර්ණ විය. මෙකී උරුමය අපට දැනෙන්නේ නියං රකුසා වැව් හා වාරි පද්ධතිය ගිල ගත් අවස්ථාවලයි. ඕනෑම රටකට කාලගුණ හා දේශගුණ විපර්යාස නිසා විටින් විට ස්වාභාවික ව්‍යසනයන්ට ගොදුරු වීමට සිදු වේ. මෙම විපත කළමනාකරණය කොට එදා රජවරුන් අපට තිළිණ කළ වැව් හා වාරි පද්ධතියෙන් උපරිම ඵල ප්‍රයෝජන ලබා ගැනීමට ඇළ, වේලි ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ආයතන උත්සුක විය යුතු ය. මේ නිසා පාලකයන්ගේ වගකීම වන්නේ වාරිමාර්ග පද්ධතිය නඩත්තුවට සහ රැක ගැනීමට හැකි සෑම විටම වගකීමෙන් සහාය වීම ය.

(ලකුණු 10 යි)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

පන්සිය පනස් ජාතක පොත එදා මෙන් අද ද පොදු ජන ප්‍රසාදය දිනාගත් සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථයකි. විවිධ ලේඛන රීතින් යටතේ ලේඛන මණ්ඩලයක ඇප කැපවීමෙන් මෙය ලියැවී ඇත. මෙම මහා පුස්තකය ධර්ම ග්‍රන්ථයක් මෙන් ම සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් ද සර්වකාලීන අගයකින් යුක්ත ය. ජාතක පොත මෙසේ ඇගයීමට ලක් වීමට බොහෝ හේතු සාධක ඇති අතර,ඉන් ප්‍රධාන තැනක් ගන්නේ හේතුඵල සබඳතාව රකිමින් යථාර්ථ රීතියෙන් එය ලියා තිබීමයි. ජාතක කතාවල ඉතිහාසය බුදුන් පහළ වීමට පෙර සමාජය තෙක් පැතිර ඇති අතර, ඒවා තුළින් ලැබෙන අත්දැකීම් කාලය, දේශය වැනි සීමාවන්ගෙන් තොරව වර්තමාන සමාජයට පවා මැනැවින් ගැළපෙන ලෙස නිර්මාණය වී ඇත. බොහෝ ජාතක කථාවන්ට වස්තු විෂය වී ඇත්තේ මිනිස් සන්තාන ගත පොදු ලක්ෂණයක් වන දුදන හා සුදන ගති වේ. විවිධ තරාතිරම්වල පුද්ගලයන් හා සමාජ තත්ත්වයන්, අවස්ථා හා චරිත තුළින් ජාතක කතාකරුවා හෙළි කරන්නේ සමාජ ක්‍රියාවලියේ සිදුවන සත්‍ය ස්වභාවය හෙවත් යථාර්ථයයි. මිනිස් ධර්මතා මානව හිතවාදී දෘෂ්ටියකින් බැලීම ජාතක කතාකරුවාගේ ප්‍රධාන කාර්යය වූ අතර ඒවා පරිසර වර්ණනා සිද්ධි හා අවස්ථා සමග සම්බන්ධ කොට ශ්‍රාවකයා හෝ පාඨකයා හමුවට ගෙන ගොස් ඇත. ඒ නිසා මිනිස් චිත්ත චෛතසික ධර්මතා අතිශය සූක්ෂම ලෙස විවරණය කිරීමට ජාතක කතාකරුවාට හැකි වී තිබේ.

1. ජාතක කතා පොත ඇගයීමට පාත්‍ර වීමට මුල් වූ හේතුව කුමක් ද ?
2. එම ග්‍රන්ථයෙහි කර්තෘත්වය පිළිබඳව මෙම ඡේදයෙහි සඳහන් කාරණය කුමක්ද ?
3. බොහෝ ජාතක කතාවන්ට වස්තු විෂය වී ඇත්තේ කවර කාරණයක් ද ?
4. ඡේදයට අනුව ජාතක කතාකරුවාගේ ප්‍රධාන කාර්යය වී ඇත්තේ කුමක් ද ?
5. ජාතක කතා වලට ඇතුළත් වන්නේ කවර සමාජයන්හි තොරතුරු ද ? (ලකුණු 10 යි)

(05) අ.පො.ස( සා පෙළ) විභාගය සඳහා පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින දරුවන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා කිහිපයක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අපේක්ෂා කරයි. මේ සඳහා දිවයිනේ අදාළ සුදුසුකම් සපුරන ඕනෑම දරුවෙකුට සහභාගී විය හැකි ය.තමාට ආසන්නතම මධ්‍යස්ථානය ද තෝරාගත හැකි ය. පුහුණු වීමේ කාලය මාස තුනකි. සතියේ දිනවල පෙ.ව. 8:30 සිට ප.ව. 4:30 දක්වා පාඨමාලා පැවැත්වේ. ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි ඉඩක් වෙන් වී ඇති මෙම පාඨමාලා අතර සූප ශාස්ත්‍රය, පරිගණක අලුත්වැඩියාව, අත්කම් නිර්මාණය ආදී ක්ෂේත්‍රයන්ට වැඩි ඉඩක් වෙන්කොට ඇත.ඔබ වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු පාඨමාලා අංශය භාර වික්‍රම් ජයවර්ධන යැයි සිතා මේ තොරතුරු ඇසුරෙන් සිසුන් දැනුම්වත් කිරීමට සුදුසු දැන්වීමක් සකස් කරන්න. මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.

**නැතහොත්,**

'ජයදිරිගම 'නගරයෙන් මදක් ඈතින් පිහිටිය ද එහි පවුල් පන්සියයක් පමණ ජීවත් වෙති. ගම් වැසියන්ට මහත් ගැටලුවක් වී ඇත්තේ තම හව බෝග අලෙවි කර ගැනීමට බොහෝ දුර ගෙවා නගරයට යාමට සිදුවීමයි.මේ නිසා කාලයත් ශ්‍රමයත් නිකරුනේ වැය වන අතර, ඇතැම් බෝග වර්ග තත්ත්වයෙන් ද බාල වීම මේ නිසා සිදු වේ. එවිට ඒවා අපේක්ෂිත මිලකට විකුණා ගැනීම ද ගැටලුවකි. මේ පිළිබඳව සලකා බලා ප්‍රදේශයේ ඇති සුදුසු බිම් කොටසක් වෙන් කොට සති පොළක් පවත්වා ගැනීමට අවසර දෙන මෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට යවන රාජකාරි ලිපිය ලියන්න.ඔබ එම ගමෙහි තරුණ සමිතියෙහි ලේකම්වරයා යැයි සිතන්න. වචන 100 -150ත් අතර සෑහේ. (ලකුණු 15 යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021-
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: III | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1 , 2 , 3 , 4 ප්‍රශ්නවලටත් 5 , 6 , 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80 යි.

---

(01) අංක ( i ) සිට ( x ) තෙක් ඇති සියලු අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

( i ) "මගේ අතමිට තිබුණ ඔක්කොම ඒ නඩුව වෙනුවෙන් වියදම් කළා"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙකු ද ?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය කුමක් ද ?

( ii ) "සේනාව ගමනට සැරසී ගෙන එන පරිද්දෙන් විධාන කරව"

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් මුල් කෘතිය ලියන්න.
(ආ) මෙය ශ්‍රවණය කළ අය කවුරුන් ද ?

( iii )
සතොස් කරන වීණා නද — ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ — ගොදුරට
........................................ — ............
සඳැස් සවන් නොකළැයි වූ — නොසතුට

(අ) මෙහි තුන්වන පේළිය සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි 'පිල්බර ගණ' යනු කවුරුන් ද ?

( iv ) (අ) ' ජාතික තොටිල්ල හෙවත් දරු නැළවිල්ල' පද්‍ය පන්තිය රචනා කිරීම ඇරඹියේ කිනම් ගමේ දී ද ?
(ආ) ' දැතේ කර ගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තිය ඇතුළත් කෘතියක් ලියන්න.

( v ) (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර රචනා කළ නවකතාවක නම ලියන්න.
(ආ) 'බිය නොවන් අයියණ්ඩි' කාව්‍ය සංග්‍රහයේ රචකයා නම් කරන්න.

( vi ) (අ) අමාවතුර රචනා වූ යුගය ලියන්න.
(ආ) සද්ධර්මරත්නාවලිය ලියා ඇත්තේ කිනම් කෘතියක් ඇසුරෙන් ද ?

( vii ) "ඇහැටවත් නොපෙනෙන සතුන්ට පුළුවන් ද මෙච්චර ලොකු මිනිස් ඇඟකට හානි කරන්න "

(අ) මෙම ප්‍රකාශය කා විසින් කරන ලද්දක් ද ?
(ආ) මෙහි රචකයා ලියූ මුල් ම කෙටි කතා සංග්‍රහය කුමක් ද ?

( viii ) (අ) හංස සන්දේශයේ කතුවරයාගේ නම ලියන්න.
(ආ) සැලළිහිණි සන්දේශය ලිවීමේ අරමුණ වූයේ කිනම් කරුණක් ද ?

( ix ) (අ) දියමන්ති මාලය කෙටිකතාව සිංහලයට නැඟුවේ කවුරුන් විසින් ද?
(ආ) ගංගාවේ සංගීතය පැදි පෙළේ රචකයා ආභාසය ලැබූ විදේශීය කවියා කවරෙකු ද ?

( x ) මෙම සම්භාව්‍ය කෘති නම් කරන්න.

(අ) ව්‍යාකරණ ශාස්ත්‍රයට අදාළව ලියැවුණු කෘතිය -
(ආ) ඡන්දස් ශාස්ත්‍රයට අදාළව ලියැවුණු කෘතිය -

(ලකුණු 2 x 10 = 20 යි)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

( i ) ශිල්පයට **උපචාර** කොටැ දැළි කප්වා නහා **පිළි පෙරළා** මවුපියන් දක් ' යි අටවියට වදනා තැනට අවුදු මඟින් පහවැ සිටියෙ......

(අ) මෙසේ සිතූ තැනැත්තා මවුපියන් දැකීමට සූදානම් වූයේ කෙසේද ?
(ආ) අංකිත පදවල අරුත් ලියන්න.

( ii ) අයි රාවණ වුවත් නාවතන රිසින් එනා
අයි රා දහස් දිලි දුනු කොත් සිපත් ගෙන
කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටිනා
වයි යාකරන් මල් තුරු ගන වන හිසිනා

(අ) මෙම පද්‍යයෙන් දැක්වෙන්නේ කිනම් ස්ථානයක් පිළිබඳව ද ?
(ආ) මෙහි අවසාන පේළියේ අර්ථය ලියන්න.

( iii ) "රජ දරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එක් තැනකට එද්ද , ඉන් එක් කෙනෙක් වැන්ද වූ නම් වැඳී පක්ෂයේ රජහට පරාජය වන්නේය...."

(අ) මෙය කිනම් උපක්‍රමයක් ලෙස හැඳින්වී ද ?
(ආ) මෙහි දැක්වෙන රජ දරුවන් දෙදෙනා හා පණ්ඩිත දෙදෙනාගේ නම් ලියන්න.

( iv ) කුමරියක් වේ මාගෙ මවු
උත්තරීතර ජන්ම ලද්දී
උරුම වූ යස ඉසුරටා
මට ද හිමි වේ වංග රාජ්‍යය
ප්‍රබල නරවර පරපුරෙන්

(අ) මෙහි 'මාගේ' යනු කාගේ ද ?
(ආ) තමාට වංග රාජ්‍යය හිමි වේ යැයි මොහු පවසන්නේ කිනම් හේතුවක් නිසා ද ?

( v ) "මුල සිට ම ඇ තමා සතු කොටස නිර්භීත ව වීරවත් ව ඉටු කළා ය.මේ භයංකර ණයතුරුස් සියල්ල ගෙවා අවසන් කළ යුතු වූයේ ය."

(අ) " ඇ " යනු කවරෙකු ද ?
(ආ) ඇ නිර්භීත ව වීරවත් ව ඉටු කළ දේවල් දෙකක් ලියන්න.

(ලකුණු 4 x 5 = 20)

(03) මහෞෂධ පණ්ඩිතයන්ගේ,
( i ) දූරදර්ශීභාවය හා
( ii ) උපාය කෞශල්‍යය

හේතුවෙන් වේදේහ රාජ්‍යය සතුරු ආක්‍රමණවලින් ආරක්ෂා විය.එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** දක්වමින් ඒ බව පැහැදිලි කරන්න.

**නැතහොත් ,**

අවට ප්‍රදේශයේ පැවති,
( i ) සශ්‍රීක බවත්,
( ii ) පාරිසරික සුන්දරත්වයත්,

හේතුවෙන් කැරගල වෙහෙර වැනුම ඉතා රසවත් නිර්මාණයක් ලෙස ඉදිරිපත් වේ.එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙන විමසන්න.

(04) බැද්දේගම නවකතාවේ,

( i ) අවස්ථා හා සිද්ධි නිරූපණයත්

( ii ) සංවාදත්

පුංචි මැණිකාගේ චරිතය පිළිබඳ ව පාඨක සිත දයානුකම්පාවෙන් පුරවයි.නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** දක්වමින් විමසන්න.

**නැතහොත් ,**

( i ) අතීත ශ්‍රී විභූතිය ඔස්සේ

( ii ) සමෘද්ධිමත් අනාගත අපේක්ෂා දැල්වීමට

කතුවරයා ගත් උත්සාහය 'දෑතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තියෙන් අපූරුවට නිරූපණය වේ.එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙන විමසන්න.

(ලකුණු 15 යි)

- 5 , 6 , 7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් පිළිතුරු සපයන්න.

(05) 'සුදුසු කාව්‍යාලංකාර යොදා ගනිමින් තම නිර්මාණය රසවත් කිරීමට ජන කවියා තුළ වූ අපූරු හැකියාව ' හානා හීය පානා අඬහැරෙන් දැනේ ' පද්‍ය පන්තියෙන් පැහැදිලි වේ.' උදාහරණ **තුනක්** දක්වමින් මෙය විමසීමක යෙදෙන්න.

(ලකුණු 10 යි)

(06) 'අවස්ථා නිරූපණයෙහි ලා අමාවතුර කතුවරයා දැක්වූ ප්‍රතිභාව හේතුවෙන් අපූරු බණ කතාවක් නිර්මාණය විය.'උදාහරණ **තුනක්වත්** දක්වමින් අදාළ කතා වස්තුව ඇසුරෙන් විමසන්න.

(ලකුණු 10 යි )

(07) 'දේශාභිමානී පද්‍ය පන්තියක් ලෙස ' මුනි සිරිපා සිඹිමින්නේ ' අගය කිරීමේදී කතුවරයාගේ ප්‍රතිභාව මනාව ප්‍රකට වේ.'උදාහරණ **තුනක්වත්** දක්වමින් මෙම කරුණ තහවුරු කරන්න.

(ලකුණු 10 යි )

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2021
සිංහල භාෂාව හා සාහිත්‍යය

11 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1 | 2 |
| 2 | 1 |
| 3 | 3 |
| 4 | 4 |
| 5 | 2 |
| 6 | 3 |
| 7 | 2 |
| 8 | 4 |
| 9 | 2 |
| 10 | 4 |
| 11 | 3 |
| 12 | 3 |
| 13 | 2 |
| 14 | 1 |
| 15 | 2 |
| 16 | 1 |
| 17 | 3 |
| 18 | 4 |
| 19 | 2 |
| 20 | 1 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 21 | 4 |
| 22 | 2 |
| 23 | 2 |
| 24 | 1 |
| 25 | 3 |
| 26 | 4 |
| 27 | 2 |
| 28 | 2 |
| 29 | 3 |
| 30 | 1 |
| 31 | 2 |
| 32 | 3 |
| 33 | 4 |
| 34 | 2 |
| 35 | 2 |
| 36 | 4 |
| 37 | 1 |
| 38 | 2 |
| 39 | 4 |
| 40 | 1 |

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2021
සිංහල භාෂාව හා සාහිත්‍යය

11 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

II පත්‍රය

(01) ( i ) ඛ , ඡ , ඨ , ථ , ඵ

( ii ) (අ) වණ - තුවාලය යන අර්ථය තිබිය යුතුය.
(ආ) වන - වනාන්තරය යන අර්ථය තිබිය යුතුයි.
(වාක්‍යයන්හි උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරැදි විය යුතුයි)

( iii ) (අ) අප නිවසට යද්දී විදුලි පහන් දැල් වී තිබුණි.
(ආ) ඔවුහු සියල්ලෝ ම කොවිඩ් මර්දන එන්නත ලබා ගත්හ.

( iv ) (අ) නිකෘෂ්ට (ආ) අලු / ආලෝක / එළිය

( v ) (අ) කර්ම විභක්තිය (ආ) සම්ප්‍රදාන විභක්තිය

( vi ) (අ) කන් + මුල (ආ) කුරුළු + ආ

( vii ) (අ) පැමිණෙත්ම - කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා / අසම්භාව්‍ය ක්‍රියා
(ආ) ආරම්භ කර - පූර්ව ක්‍රියා

( viii ) මඳ අඳුර , තාරපති

( ix ) (අ) ගුරුවරුන් විසින් සිසුහු ඇගයීමට ලක් කරන ලදහ /ලැබූහ / ලද්දෝය.
(ආ) විදුහල්පතිතුමා විසින් මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ ගුරුවරියක් දැනුම්වත් කෙරෙයි / කරනු ලබයි.

( x ) (අ) පුනරුත්ථාපනය (ආ) අනභිභවනීය

(02) රචනාව : ලකුණු විග්‍රහය

සාරවත්භාවය , මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08
සංවිධානය , නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12
ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම - ලකුණු 05

(03) සාරාංශය : ලකුණු විග්‍රහය

| | | |
|---|---|---|
| අන්තර්ගතය | - | ලකුණු 06 යි. |
| වචන ප්‍රමාණය | - | ලකුණු 02 යි. |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 යි. |
| මුළු ලකුණු ප්‍රමාණය | - | ලකුණු 10 යි. |

අන්තර්ගත විය යුතු ප්‍රධාන අදහස් :

- අතීත පාලකයන්ගේ මූලික රාජ්‍ය ප්‍රතිපත්තිය වූයේ කෘෂි කර්මාන්තයේ ජීවනාලිය බඳු වූ වාරි මාර්ග පද්ධතිය ශක්තිමත් කිරීම යි.
- එමගින් රට සහලින් ස්වයංපෝෂිත විය.
- නාගරීකරණය නිසා සමාජ අවශ්‍යතා වැඩිවෙද්දී වැව් වලට අමතර ව ඇළ මාර්ග තැනීම ද සිදුවිය.
- මේ නිසා දෙපස ජනාකීර්ණ වී එම ප්‍රදේශවල ආර්ථික සංවර්ධනයක් ද ඇතිවුණි.
- ස්වභාවික ව්‍යසනවල දී වැව් හා ඇළවල් ආරක්ෂා කර ගැනීම අප කළ යුතු ප්‍රධාන කාර්යයි.
- ඒ සඳහා ජල කළමනාකරණය කිරීමට අප උත්සුක විය යුතු අතර මෙහි දී පාලකයන්ගේ වගකීම වන්නේ වාරි පද්ධතිය නඩත්තු කිරීම හා රැක බලා ගැනීමයි.

(04) අවබෝධය

1. හේතුඵල සබඳතාව රකිමින් යථාර්ථ රීතියෙන් එය ලියා තිබීම.
2. ලේඛක මණ්ඩලයකගේ ඇප කැප වීමෙන් මෙය ලියැවී ඇති බව.
3. මිනිස් සන්තානගත පොදු ලක්ෂණයක් වන දූදන හා සුදන ගති
4. මිනිස් ධර්මතා මානව හිතවාදී දෘෂ්ටියකින් බැලීම.
5. බුදුන් පහළ වීමට පෙර සමාජය

(ලකුණු 2 x 5 = 10යි)

(05) ප්‍රායෝගික ලේඛන : දැන්වීම සහ රාජකාරි ලිපිය

| | | |
|---|---|---|
| ආකෘතිය | - | ලකුණු 04 යි. |
| අන්තර්ගතය | - | ලකුණු 08 යි. |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 03 යි |
| මුළු ලකුණු ප්‍රමාණය | - | ලකුණු 15යි. |

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2021
සිංහල භාෂාව හා සාහිත්‍යය

11 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

III පත්‍රය

(01) ( i ) (අ) මහල්ලා / සීයා / මහලු සීයා
(ආ) බැද්දේගම

( ii ) (අ) පන්සිය පනස් ජාතක පොත
(ආ) එක් සියයක් රජ දරුවන්

( iii ) (අ) මෙසෙස් රුවින් තම මැවුවත් ඔබහට
(ආ) මොනරු / මයුරයෝ / සිකි

( iv ) (අ) පල්ලේගම කෝලාන ගමේ දී
(ආ) ප්‍රබුද්ධ / නොපළ ගීත

( v ) (අ) මළගිය ඇත්තෝ / මළවුන්ගේ අවුරුදු දා / විලාසිනියකගේ ප්‍රේමය / හෙට එච්චර කළුවර නෑ
(ආ) රත්න ශ්‍රී විජේසිංහ මහතා

( vi ) (අ) පොළොන්නරු යුගය
(ආ) ධම්මපදට්ඨ කථාව

( vii ) (අ) අම්මා
(ආ) පුනුරුත්පත්තිය සහ තවත් කෙටිකතා

( viii ) (අ) වීදාගම මෛත්‍රී හිමි
(ආ) උලකුඩය දේවියට පුත් රුවනක් ලබා දෙන ලෙස කැලණියේ විභීෂණ දෙවියන්ට ආරාධනා කිරීම.

( ix ) (අ) කේ.ජී.කරුණාතිලක මහතා
(ආ) රවින්ද්‍ර නාත් තාගෝර් / තාගෝර්

( x ) (අ) සිදත් සඟරාව
(ආ) එළු සඳැස් ලකුණ

(02) ( i ) (අ) ගුරු පූජාව පවත්වා , රැවුල කපා , නා ගෙන ,ඇඳුම් මාරු කර

(ආ) පූජාව - සත්කාරය / ඇඳුම් මාරු කර

( ii ) (අ) සෙබළුන් විසින් රැක සිටින කයිකාවල නම් මුරපොළක්

(ආ) මල් ගසින් ගහන වූ වනයට උඩින් වහා පියාසර කරන්න.

( iii ) (අ) ධර්ම යුද්ධය

(ආ) වේදේහ රජු - චූලනී බ්‍රහ්මදත්ත රජු
මහෞෂධ පණ්ඩිතයන් - කේවට්ට බමුණා

( iv ) (අ) සිංහබාහුගේ

(ආ) තම මව රජ කුමරියක් වීම/ප්‍රබල රජ පරපුරෙන් පැවත එන නිසා

( v ) (අ) මැටිල්ඩා ලොයිසල්

(ආ) සේවිකාව අස්කර දමා නිවසේ වැඩ තනිවම කර ගැනීම / නිවස වෙනස් කර කුඩා කාමරයක වාසයට පැමිණීම / සියලු සේදීම් කටයුතු /බඩු මිලදී ගැනීම් / දුප්පත් ගැහැනියක ගැහැණියක මෙන් ඇඳුම් පැළඳුම් කිරීම.(පාඩමට සම්බන්ධ වෙනත් පිළිතුරු ද නිවැරදි සේ සලකන්න)

(03) ( i )

- ඇතුළු නුවර හුන් දිළිඳුන් පිටත් කරවා ......
- අද පණ්ඩිතයන් වහන්සේට කිව යුතු කිසිවක් අසමි......
- යමෙක් ඊ දණ්ඩක බැඳ විද වී පතක්.......
- බෝධි සත්ත්වයන් වහන්සේ විසින් ඒ ඒ රජ්ජුරුවන් සමීපයෙහි සිටුවන ලද පුරුෂයෝ ද
- තපස්වීන් ලබා හිමාලයෙන් ගෙන්වූ මැටි හා ඇඹුල බිජු

( ii )

- පින්වත්නි තෙපි හැම සතුරො වටලා ගන්නෙ වේ දැයි .....
- දේවයන්වහන්ස කේවට්ටයා මැණිකකින් වඤ්චා කරනු...
- පණ්ඩිතයෙනි තොපට සුදුසු පඩුරක් සොයන්නෙම් ....
- ....බෝසතාණන් වහන්සේ බැණ නැඟි හඬ සියලු චතුරගෙන් ......

(මේ හා සමාන අදහස් ඇති පිළිතුරු ද නිවැරදි සේ සලකන්න.)

**නැතහොත් ,**

( i )

- පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
- නිබඳ පැසී පල ලබදෙන මිහිරඹය
- සාර එලය අඹ දඹ රඹ ද වල්පිට
- මහත් තුරු මියුරු එල ගෙන නැමී අතුය.

( ii ) කුළින් කුළ ට සිහිල' ඔ වැහෙන කඳුරැය
දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය
තුඩුරු වැ සිහිලැ ' ලීය ගඟුලැ ලීය
පවන'ද පිපී තුරේය නිරතුරේය .....

(04) ( i )
- හේන් වාරයට හේන්වල....... ඈ වැඩ කළාය .
- කෑ හැකි කොළ වර්ග අල වර්ග ........ඈ වනයට ගියාය .
- බහුකතාවලට කන් දී පැය ගණන් සිට හැන්දෑවට කුඹුරුපිටිය දෙසට වැටී ඇති..
- ජනාකීර්ණ සමහර ගම් මැදින් බියපත් සිවල් දෙනක මෙන්
- සාමාන්‍ය අන්දමට ශෝකය ප්‍රකාශ කිරීමට
- කඳුලක් , වත් නො හෙළා ඈ බලා සිටියා පමණි .

- ලෙඩට බේත් කොච්චර තිබුණත්(වෙද රාළ හා පුංචි මැණිකා )
- උඹ ගමට පලයන් ළමයා (මහලු සීයා හා පුංචි මැණිකා )
- මොකද්ද එයාගේ නම කොහෙද ගම
- නෑ අයියා සතයක් වත් නෑඅපි බොහෝම... } පුංචි මැණිකා හා හිරපල්ලා

( ii )
- දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
- ණය නැති බිය නැති නිවහල් යුගයක
- දෙදහස් පන්සිය වසරක් තිස්සේ
- හෙට ඉදිවන නව ලෝකය දැක දැක

(05)
උපමා - එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
එළිසමය - ඕනෑම පද්‍යයක්
විරිත - මාත්‍රා 17 කින් යුත්
අනුප්‍රාසය - නාහින දෙහින / යුද ඇති දා නැති කග

(06)
- හර්ග හා කොසොල් රජු සංවාදයේ යෙදෙන අවස්ථාව
- දිසාපාමොක් ඇදුරු හා සෙසු දරුවෝ අතර කතාබහ අවස්ථාව
- දිසාපාමොක් හා අහිංසක සංවාදයේ යෙදෙන අවස්ථාව
- අඟුල්මල් සොරු හා බුදුන් වහන්සේ හමුවන අවස්ථාව
- අඟුල්මල් දමනය වන අවස්ථාව
- බුදුන් හා කොසොල් රජු හමු වන අවස්ථාව
- බුදුන් වහන්සේ හා අංගුලිමාල තෙරුන් සංවාදයේ යෙදෙන අවස්ථාව

(07)
- නිදහස මහ මුහුදක් වේ
- ජාතික රණ දෙරණ මතේ
- තමන් ලැබූ දිවි පෙවෙතේ
- ජාතිය රන් විමනක් වේ
- ඉටු කොට කළ යුතු යුතුකම්

(ඉහත උදාහරණ අදාළ ලෙස යොදා ගනිමින් පිළිතුරු ලිවීම අපේක්ෂිත ය.)